කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2018/2019

**INR 3164 - ජාත්‍යන්තර ආරක්ෂාව**

කාලය: පැය දෙකයි (02)

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න

1. "ආරක්ෂාව යනු අත්‍යාවශ්‍යයෙන්ම වාදයට බඳුන් වූ සංකල්පයකි" (ඩබ්ලිව්. බී. ගාලි). ("Security is essentially a contested concept" W.B. Gallie). ජාත්‍යන්තර සබඳතා අධ්‍යයන විෂය තුළ ආරක්ෂාව පිළිබඳ අධ්‍යයනයන් (Security Studies) විකාශනය වීම ඇසුරින් මෙම කියමන විවේචනාත්මකව විභාග කරන්න.

2. ඉන්දියාව සහ පකිස්ථානය අතර අනාගත න්‍යෂ්ටික යුද්ධයක් ඇති වීමේ හැකියාව මගින් පුරෝකථනය කරනු ලබන කලාපීය සහ ජාත්‍යන්තර භූදේශපාලනික ආරක්ෂක ඇඟවීම් (geopolitical implications) විභාග කරන්න.

3. එඩ්වර්ඩ් ස්නෝවඩන් (Edward Snowden) සහ ජූලියන් අසාන්ජ් (Julian Assange) රහසිගත තොරතුරු පාවාදුන්නවුන් (Whistle blowers) බවට පත්වූයේ රාජ්‍ය ආරක්ෂාවට වඩා මානව ආරක්ෂාවට ප්‍රමුඛතාවය ලබාදීම නිසාවෙනි. සාකච්ඡා කරන්න.

4. කොටස් දෙකටම (02) පිළිතුරු සපයන්න
   i. 'සාමුද්‍රික ආරක්ෂාව' (Maritime Security) යන සංකල්පය නිර්වචනය කරන්න.
   ii. 'ඉන්දියානු සාගර කලාපයේ' (Indian Ocean Region – IOR) සෝමාලි මුහුදු මංකොල්ලකෑම (Somali Piracy) මගින් ඇති කර තිබෙන ආරක්ෂක තර්ජන විශ්ලේෂණය කරන්න.

5. අදාළ සිද්ධි අධ්‍යයනයන් ඇසුරින්, අවි ගැටුම් කලාපයන් තුළට එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා ක්‍රියාන්විතයන් (United Nations Peacekeeping Operations – UNPKOs) අනුයුක්ත කළද අපේක්ෂිත අරමුණු නිරන්තරව ඉටු කරගැනීමට නොහැකි වන්නේ ඇයිදැයි විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

6. මැදිහත්කරණයට ලැදි බටහිර රාජ්‍යයන් විසින් 'ආරක්ෂාව සඳහා වූ වගකීම' ධර්මතාවයට (Responsibility to Protect [R2P] Doctrine) ලබාදී ඇති ආචාරවිද්‍යාත්මක අර්ථකථනයන් (normative interpretations) සහ ප්‍රායෝගික ක්‍රියාවට නැංවීම් (practical implementations) විභාග කරන්න.

**********